**රංජිත් ගමගේ**
(මැදපෙරදිග සිට)

# "යහපාලන කැඩපත තුල නොපෙනෙන විගාමික ශ්‍රමිකයාගේ සැබෑ මුහුණුවර"

යහ පාලනයට මාස පහළොවක් ගෙවී ගියේය. විගාමික ශ්‍රමිකයා වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමට යෝජිත සාධනීය වැඩපිලිවෙලක් ආණුඩුවේ න්‍යායපත්‍රවල තිබුනේ නැත. වඩාත් නම්‍යශීලී ආණුඩුව විගාමික ශ්‍රමිකයා ගැන උනන්දුවෙක් දැක්වූයේ නැත. ඔවුන් හිතාමතාම ඒ අවිථාව මගහැරියේය. පැවති ආණ්ඩුවද යම් යම් දේ පෙර්ජනාකලත් කිසිවක් ක්‍රියාත්මක කලේ නැත. අපේ රටේ වෘත්තිකයන්ට මෙන් ජනතාව ප්‍රාණ ඇපයට තබාගෙන තමන්ගේ ඉල්ලීම් වෙනුවෙන් පෙනී සිටින්නට විගාමික ශ්‍රමිකයාට හැකි ක්‍රමවේදයක් වත් පෙනෙනතෙක් මානයේ නැති නිසාම පැවති කිසිම ආණ්ඩුවකට මේ විගාමීක ශ්‍රමිකයා වැදගත් වූයේ ද නැත.

විගාමික ශ්‍රමිකයා ගැන කථාකරන්නට ආසන්නම සිදුධිය අපට ඇසෙන්නේ කුවේට් රාජ්‍යයෙනි. ඒ පසුගිය මාර්තු 8 වෙනිදා මත්ද්‍රව්‍ය චෝදනා යටතේ ශ්‍රී ලාංකික ගෘහසේවිකාවකට කුවේට් අධිකරණය මගින් මරණ දණ්ඩනය නියම කිරීම හරහාය. ශ්‍රී ලංකාවේ බලධාරීන් තවමත් ඒ ගැන නිහඬය. විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිලධාරීන්ට මේ පිලිබඳව තොරතුරු නිල වශයෙන් ලැබී නැතැයි ද ඔවුන් ඒ ගැන සොයා බලන්නට කටයුතු කරන බවද මාධ්‍ය වාර්ථාකර තිබිණි. කාන්තාව සම්බන්ධයෙන් චෝදනාව කුමක් වුවත් ඒ පිළිබඳව බලධාරීන් දැනුවත් නැත. විගාමික ශ්‍රමිකයාගේ සුරක්ෂිතතාවය වෙනුවෙන් පෙනී සිටින ආයතන බලධාරීන් යම් විගාමික ශ්‍රමිකයෙකුට මරණ දඩුවමක් නියමකරන තුරු ඒ පිලිබඳව කිසිවක් නොදැනසිටීමෙන් පෙන්නුම්කරනුයේ විගාමික ශ්‍රමිකයාගේ හෙට දවසේ ඛේදජනක ඉරණාමයි.

මාස කිහිපයකට පෙර ගල් ගසා මරා දමන්නට සෞදිඅරාබියේ අධිකරණයක් දුන් තීන්දුව සිරදඬුමක් දක්වා ලිහිල් කර ගැනීමේ සිද්ධිය ආණ්ඩුවේ මැති ඇමතිවරු යහපාලනයේ ජයග්‍රහණයක් ලෙස සැමරීය. මාධ්‍ය සංදර්ශන පවත්වමින් පමණක් නතර නොවී වසර කීපයකට පෙර හිසගසා මරා දැමූ ගෘහසේවිකා රිසානා නාෆික් ගේ සිද්ධිය හා සසඳමින් පැවැති රජයට පහර දෙන්නට අවස්ථාවක් කර ගත්තේය. ගල් ගසා මරා දමන්නට නියමවූ කාන්තාව සම්බන්ධ යෙන් කටයුතු කල ආකාරය යහපාලනයේ රාජ්‍ය නාත්ත්‍රික සබඳතාවල ප්‍රතිඵලයක් ලෙස බැලූ බැල්මට පෙනුනත් භාෂා පරිවර්තකයෙකු විසින් නඩුව මෙහෙයවා ගල් ගසා මරා දමන්නට අධිකරණයෙන් නියම කරන තුරුම ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හෝ විදේශ සේවා නියුක්ති කාර්යාංශය ප්‍රමාණවත් මැදිහත් වීමක් සිදුකලේ නැති බව කිය යුතුය. මේ සම්බන්ධයෙන් නීති උපදේශන ප්‍රමාණවත්ව ලැබුනේ නම් ගැටළු දුර දිග යා නොදී කලින් නිරාකරණය වීමට බොහෝ දුරට ඉඩ කඩ තිබිණි.

රිෂානා නෆීක් සිද්ධිය ගත් කල බාලවස්කාරියක් ව්‍යාජ ගමන්බලපත්‍රයක් මගින් විදේශ ගත වීම තුල අදාල මැදිහත්වීම් වලට යම් යම් සීමාවන් තිබූ බවද නොරහසකි. පැවති ආණ්ඩුවේ බලධාරීන් ඒ සම්භන්දයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකලේ නැත. දේශපාලන හිතවතුන් හෝ තැරැව්කරුවන් යම් යම් වරප්‍රසාද භුක්ති විඳිමින් නියාමනය කිරීමේ වැඩපිලිවෙලක් ඔවුන් ක්‍රියාත්මක කලේ නැත.

පසුගිය ආණුඩුව කාලයේ මේ රාජ්‍ය ආයතන තුළ තම දේශපාලන හිතවතුන් සතුටුකරන්නට රැකියා සම්පාදනය කරගත්හ. පරාජිත දේශපාලඥයෝ තානාපති සේවයට මෙන්ම විදේශ සේවා නියුක්ති කාර්යාංශය වැනි ආයතන තුල ඉහළ තනතුරුවලට පත්කරගත්තේ ඔවුන්ගේ දේශපාලන න්‍යාය පත්‍ර ක්‍රියාවට නගන්නටය. ඇන්දවීමේ කලාව හොඳින් දැන සිටි පාලකයෝ විගාමික ශ්‍රමිකයා රට විරුවා ලෙස ඇන්දවීමට උත්සාහ කල යුගයක් අපට මතකය. මේ දේශපාලන ඕනෑ කම් සඳහා නඩත්තු වෙනුවෙන් සිය ප්‍රථම විදේශගතවීමේ සිට දෙවසරකට බර පැන දැරුවේ විගාමික ශ්‍රමිකයාය.

විගාමික ශ්‍රමිකයන් වැඩි දෙනෙක් සේවය කරන්නේ මැද පෙරදිග කලාපයේ ගෘහසේවිකාවන් ලෙසය. නිතර හිංසනයට සහ ගැටළුවලට පත්වන වඩාත්ම සංවේදී වූ අංශය මෙයයි. බොහෝ අවස්ථාවල නිශ්චිත වැඩමුරයක් ඔවුන්ට නැත. නිවාඩු නැත. ගිවිසගත් ආකාරයට පඩි ලැබෙන්නේ නැත. අතිකාල දීමනා නැත. වෛද්‍ය පහසුකම් අවම මට්ටමක හෝ ප්‍රමාණවත් නැත. ගෘහාශ්‍රිතව කායික හෝ ලිංගික හිංසනයට ලක්වීමේ අවදානම වැඩිය.

අපේ තානාපති කාර්යාල හරහා ඔවුන්ගේ ගැටළු නිරාකරකරණ්‍ය කරගැනීමේ සාධනීය ක්‍රමවේදයක් ඔවුන්ට නැතුවා මෙන්ම මැද පෙරදිග කලාපයේ ඇතැම් තානාපති කාර්යාල මේ කාන්තාවන් බොහො දෙනෙක් ගෘහ සේවිකාවන් ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භකරන්නේම විදේශ ගතවීමෙන්ය. ඔවුන් අවතැන්වූයේ යුද්ධයෙන්ය. නොඑසේනම් පවුලේ පියා හෝ ස්වාමිපුරුෂයා වකුගඩු රෝගයෙන් හෝ පිළිකා රෝගයෙන් පීඩා විඳී. පවුලේ එදිනෙදා නඩත්තුවට ආදායමක් නැත. වගාකල කුඹුරු හෝ ඉඩම් උකස් වී ණය ගෙවාගත නොහැකි.ය නිවසක් තනාගැනීමට හෝ දරුවන්ගේ අධ්‍යාපනයට මුදල් නැත. පවුලේ මව, සොයුරිය හෝ වැඩිමහල් දියණිය ගෘහසේවිකාවක් ලෙස විදේශගතවීම එකම සිහිනය ලෙස දකින්නේ ගේ දොර ලඟටම එන විදේශ රැකියා ඒජන්සි කරුවන් මාර්ගයෙන් හෝ හිතවතෙකුගේ මාර්ගයෙනි. ඔවුන්ට වෘත්තීය පළපුරුද්දක් නැත. සමාජීය දැනුම හා අවබෝධය අවම මට්ටමක පවතී, සිය රැකියාව ආරම්භකරන්නේම නුපුරුදු දේශගුණික හා සංස්කෘතික තත්වයන් තුල තම කායික සහ මානසික අවශ්‍යතාවයන් ඉදිරියේ ඔවුන් අසරණය. මේ රැකියා අවස්ථා ස්ථිර නොවූ හෝ විධිමත්ව සංවිධානය නොවූ අංශයක් ලෙස සැලකිය හැකි. ශෝචනීයම සිද්ධිය නම් අපේ රටේ ජාතික අදායමට ඉහළම දායකත්වය සපයන්නේ මේ අවිධිමත් ශ්‍රම බලකාය වීමය. අපි නොසළකාහරින්නේ ඔවුන්වය. නිසි ඇගයීමක් හෝ පිලිගැනීමක් සමාජය තුල ඔවුන්ට ලැබෙන්නේ ද නැත. සිය සේවා කාලය සම්පූර්ණ කර ආපසු සිය රටට පැමිණෙන විගාමික ශ්‍රමිකයා වෙනුවෙන් විශ්‍රාම වැටුප් ක්‍රමයක් හෝ සමාජ ආරක්ෂන වැඩපිලිවෙලක් ක්‍රියාත්මක නොවීම තුල නැවතත් විදේශ ගත වෙනවා හැරෙන්නට වෙනත් විකල්පයක් ඔවුන්ට නැත. මව විදේශගතවූ පවුල් ඒකක තුල කුඩා දරුවන්ගේ සෞඛ්‍ය, පෝෂණය සහ අද්‍යාපනය සම්බන්ධයෙන් පැන නගින ගැටළු මෙන්ම වැඩිමහල් ගැහැණු දරුවන්ගේ ආරක්ෂාව සහ ලිංගික හිංසනය හරහා වෙනසක් ඇතිකළ හැකි සමාජ සුභ සාධන වැඩපිලිලෙක් ක්‍රියාත්මක වන්නේද නැත.

තත්වය මෙසේ තිබියදී විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි නොවී විදේශගත වී යම් ගැටළුවකට මුහුණපාන විගාමික භ්‍රමිකයා වෙනුවෙන් කාර්යාංශය මැදිහත් නොවන බව හ ාසිය සේවාකාලය සම්පූර්ණ නොකරන විගාමික ශ්‍රමිකයින් ආපසු ගෙන්වා ගැනීමට කටයුතු කරන්නේ නැති බව අදාල අමාත්‍යාංශය භාර ඇමතිවරිය මෑතකදී ප්‍රකාශ කලාය. විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිවීමකින් තොරව විදේශ ගතවීම නීතිමය තත්වයන් තුල වරදක් ලෙස පෙන්විය හැකි වුවද මෙතෙක් විදේශ රැකියා ඒජන්සිකරුවන් නියාමනය කිරීමේ වැඩපිලිවෙල නීත්‍යානුකූල නොවන අයුරින් මෙසේ විදේශගතවීමේ පසුබිම මානුෂීය මුහුණුවරකින් සාකච්ඡා විය යුතුය. එමෙන්ම කිසියම් විගාමික ශ්‍රමිකයෙක් තම සේවාකාලය සම්පූර්ණ නොකර ආපසු සිය රටට පැමිණෙන්නේ ඔහුට හෝ ඇයට තවදුරටත් දරාගත නොහැකි කායික හෝ මානසික පීඩනයක් නිසාය. බොහෝ විට ඔවුන් තම ජීවිතයෙන් වන්දිගෙවන්නට පෙර මේ තීරණයට එළඹුනා විහ හැකිය. නොඑසේනම් කිසිම විගාමික ශ්‍රමිකයෙක් තම අරමුණු සාකෂාත් කරගන්නේ නැතිව ආපසු සිය රට පැමිණෙතැයි සිතිය නොහැකිය.



ෑණ ගැසීම්, පිලිස්සීම් වැනි දරුණු කායික පීඩනයකට ලක්වෙන්නේ මේ කාන්තාවන්ය. තවත් සමහර කාන්තාවන් සදාකාලිකව අංග විකලවී මව් බිමට පැමිණෙයි. තට්ටු ගොඩනැගිලි වලින් බිමට පැන සිය දිවි හානිකරගත් අවස්තා අසන්නට ලැබේ. මිය ගිය අයගේ ශරීර කොටස් අතුරුදහන්ය. ඔවුන්ගේ මරණ වලට සාක්ෂි නැත. පරීක්ෂණ නැත. පවුලේ සාමාජිකයන්ට සිය ඥාතියා වෙනුවෙන් සාධාරණය ඉටුවෙන්නේද නැත. මේ ගැටළු වලට විසඳුම් අදාල සංදර්භය තුල විමසනවා වෙනුවට අගතියට පත් විගාමික ශ්‍රමිකයා තව දුරටත් පීඩනයක් යෙදීමෙන් නිරාකරණය කල හැකි දැයි වගකිවයුතු අංශ වෙතින් විමසිය යුතුය. පැවති ආණ්ඩුවේ අදාල අමාත්‍යාංශය භාර ඇමතිවරයා රිෂානා නෆීක් ගේ හිස ගසා දමන මොහොතේත් හාස්‍යජනක ප්‍රකාශ කරමින් සිටිය බව අපට මතකය. මේ ඇමතිවරු දෙපොලම යහපාලනය වෙනුවෙන් පෙනීම සිටීම එක්තරා ආකාරයක ජුගුප්සාජනක සිද්ධියකි.

රටේ අභිමානය ගැන දොඩමින් මැදපෙරදිග කලාපයට ගෘහසේවිකාවන් යැවීම නතර කරනවා යැයි කියූ මනෝරාජික කතා අපට අසන්න ලැබුනේ අද ඊයේ නොවේ. ඒ කෙසේ වෙතත් ශ්‍රමිකයන් තව තවත් රට පටවනවා හැරෙන්නට වෙනත් විකල්පයක් තිබේ දැයි විමසීම කාලෝචිතය.

සිදුවිය යුත්තේ වඩාත් සංවිධානය වූ ව්‍යවසායක් තුල පුහුණු ශ්‍රම බලකායක් රැකියා අවස්තා සඳහා යොමු කිරීමයි. සිවිල් සමාජ ක්‍රියාකාරීන් ගේ හඬ ප්‍රබල වුවත් සිද්ධියක් අරබයා පිබිදෙන උද්ඝෝෂණ වලින් ඔබ්බට ගිය පුළුල් කතිකාවක් සඳහා පෙලගැස්වීම කාලීන අවශ්‍යථාවයකි. මෙහිලා නීති රීති සම්පාදනයේ ලා මෙන්ම වඩාත් මානුෂීය මුහුණුවරකින් විගාමික ශ්‍රමිකයාගේ ගැටළු හඳුනාගෙන ඔවුන් සවිබල ගැන්වීම යහපාලන ආණ්ඩුවේ බලධාරීන්ගේ වගකීමක් බව අමුතුවෙන් සඳහන් කලයුතු නැත.

අති දක්ෂ කැරවෑන් සාදන්නෙක් අවශ්‍යයි
කැරවෑන් සැලසුම් මොඩල් සහ සෑදීම පිලිබඳ
මනා දැනුමක් පළපුරුද්දක් ඇති අය කරුණාකර

අමතන්න
**සමන් 0490 104 398**